# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2489/71 - 2026 මැයි මස 22 වැනි සිකුරාදා - 2026.05.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය, එච්. එම්. සුසිල් රණසිංහ වන මම, එකී මණ්ඩලයට, මාතර අධියර IV ජල සම්පාදනය ව්‍යාපෘතිය යටතේ ජල පවිත්‍රාගාරයේ සිට පොම්පීකරණ නල මාර්ගය එලීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චිත දේපල අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වෛද්‍ය එච්. එම්. සුසිල් රණසිංහ,**
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : MHCWS/LPL/04/570.
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය,
12 වන මහල, සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල.

**උපලේඛනය**

දකුණ පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 349 A - නාරංගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නාරංගල ගමේ පිහිටි, මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සකස්කර ඇති කැඩැස්තර සිතියම් අංක : 820143, කලාප 1, පත්‍ර අංක 1, පිඹුරේ කැබලි අංක 02 ලෙස දැක්වෙන “ජම්බුගහලියද්ද” , නැමති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 10ක් වන ඉඩම් කොටස :


1A - G 46897 — 07 (2026/05)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් කැබලි අංක 02 ප්‍රමාණය : පර්චස් 10** :

| | | |
|---|---|---|
| *උතුරට* | : | සේනානායක ගමගේ සාලිය ගෝවින්ද හිමිකම් කියන ජම්බුගහලියද්ද සහ මෙම පිඹුරේ කැබලි අංක :01; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක : 01 : මාර්ගය (ප්‍රදේශීය සභා) සහ හිමිකරු සොයාගත නොහැකි මුරුතගහමුලන ; |
| *දකුණට* | : | හිමිකරු සොයාගත නොහැකි මුරුතගහමුලන සහ සේනානායක ගමගේ සාලිය ගෝවින්ද හිමිකම් කියන ජම්බුගහලියද්ද ; |
| *බටහිරට* | : | සේනානායක ගමගේ සාලිය ගෝවින්ද හිමිකම් කියන ජම්බුගහලියද්ද ; |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය*

සේනානායක ගමගේ සාලිය ගෝවින්ද මහතා,
"අයන්සා",
නාරංගල,
කරගොඩ - උයන්ගොඩ.

EOG 05 - 0228

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.